# ප්‍රවෘත්ති නිවේදනය.

## PRESS RELEASE

සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.
Ministry of Health Nutrition and Indigenous Medicine
Telephone: Office: 2693919 Gen: 2694033, 2669192, 2675011, 2675449 Fax: 2689540

2016.01.01

**ඖෂධ හා උපකරණවලට අදාල ටෙන්ඩර් වලදී සිදුව ඇති අක්‍රමිකතා හේතු කොට ගෙන 2016 වසරේ දී ඖෂධ හා උපකරණ මිලදී ගැනීම් සදහා වූ ටෙන්ඩර් ක්‍රමය වෙනස් කරන බව සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය දොස්තර රාජිත සේනාරත්න මැතිතුමා පවසයි.**

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව විසින් කොළඹ ජාතික රෝහලේ විකලාංග රෝග ශල්‍යකර්ම සඳහා අවශ්‍ය රුපියල් මිලියන 3.8 ක වටිනාකමකින් යුත් වෛද්‍ය උපකරණ පරිත්‍යාග කිරීමේ උත්සවයක් ඊයේ (01) දින සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය දොස්තර රාජිත සේනාරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කොළඹ ජාතික රෝහලේ දී පැවැත්විණ. එහිදී අමාත්‍යවරයා මෙම අදහස් පළ කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ සෞඛ්‍ය අමාත්‍යවරයා - "මම සෞඛ්‍ය අමාත්‍යවරයා ලෙස වැඩ බාර ගන්නා විට ඖෂධ හා උපකරණ පිළිබඳ බොහෝ ප්‍රශ්ණ තිබුනා. ජනවාරි 08 මැතිවරණ වෙලාවේ වේදිකාවේ සෞඛ්‍ය ගැටළු පිළිබඳ බොහෝ අය කතා කළා. එම කරුණු පිළිබඳ ජනතාව අවධානය යොමු කළා."

**"දැනට දිවයිනේ සියළු රෝහල්වල හා සෞඛ්‍ය ආයතනවල පවතින වෛද්‍ය උපකරණ හිඟයක් ඉක්මනින්ම මම අවසන් කරනවා. එමෙන්ම ටෙන්ඩර් වලදී ඇතැම් සමාගම් සමග ගනුදෙනු කර තිබෙනවා. එහිදී භාවිත කිරීමට නොහැකි උපකරණ පවා ලැබී තිබෙනවා. එම නිසා මෙම වසරේ මැද භාගය වන විට ඖෂධ හා උපකරණ මිලදී ගැනීම් සදහා වූ ටෙන්ඩර් ක්‍රමය වෙනස් කරනවා. එමෙන්ම අයවැයෙන් වෙන් වුන මුදල් ගැන කිසිම ප්‍රශ්ණයක් නැහැ. රෝහල්වල භෞතික සම්පත්, යටිතල පහසුකම් සංවර්ධනය කළ යුතුයි. අපි ඒ සදහා අවශ්‍ය කටයුතු සිදු කරනවා. තවත් විශේෂ කරුණක් තමයි භාවිත නොකළ ඖෂධ මිලියන 300 ක් විතර වසරක දී විනාශ කරනවා මෙයත් විශාල ව්‍යාපාරයක්. ඒ පිළිබඳව මගේ විශේෂ අවධානය මම යොමු කරනවා."**

"ඖෂධ මිල අඩුකිරීම පිළිබඳ සකස් කළ මිල සූත්‍රයට සමාගම් ද එකඟ වී තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය විතරක් වසරකට රුපියල් බිලියන 04 ක ඖෂධ ආනයනය කරනවා. දිවයිනේ සියළු රෝහල් සම්බන්ධ වන පරිදි ඖෂධ හිඟය මගහැරවීම සදහා මේ වනවිට මෘදුකාංගයක් හදුන්වා දී තිබෙනවා. ඖෂධ ටෙන්ඩර් මගින් ලබා ගැනීමේ දී විවිධ ක්‍රම සකස් කරගෙන තිබෙනවා. දැන් ඔන්ලයින් ක්‍රමයට ඖෂධ ආනයනය කරන්න පුළුවන්. ඖෂධ හිඟයක් පිළිබඳ පාර්ලිමේන්තුවේදීවත් කතා කළේ නැහැ. රෝග පරීක්ෂණ කටයුතු පෞද්ගලික අංශයෙන් සිදු කිරීම මේ වනවිට තහනම් කර තිබෙනවා. සියළුම වෛද්‍ය පර්යේෂණ රජය මගින් සිදු කිරීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතු වෙනවා." යැයි ද අමාත්‍යවරයා වැඩිදුරටත් පැවැසීය.

මෙම අවස්ථාවට කොළඹ ජාතික රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා, රාජ්‍ය ඖෂධ සංස්ථාවේ සභාපති වෛද්‍ය සදුර සමරසුන්දර මහතා, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ කළමනාකරණ අධ්‍යක්ෂ පී. සුන්දරලිංගම් මහතා ඇතුළු පිරිසක් එක්ව සිටියහ.

නිපුන් ඒකනායක,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගේ මාධ්‍ය ලේකම්.